# ශාස්ත්‍රීය ප්‍රභාෂණය - 2023 - සිංහල අධ්‍යයන අංශය

# කැලණිය විශ්වවිද්‍යාලය

## පර්යේෂණ පත්‍රිකා ලබාගැනීම

### සංස්කෘතික අනන්‍යතාව සහ සිංහල භාෂා සාහිත්‍ය අධ්‍යයන

භාෂාව යනු සංස්කෘතියක පිළිබිඹුව යි. ලෝකය පුරා පැහැදිලි ව පෙනෙන සංස්කෘතික විවිධතාව භාෂාවලට අනන්‍යතාවක් ලබාදෙයි. සංස්කෘතිය යනු සතතයෙන් වර්ධනය වන ප්‍රපංචයක් වන හෙයින් භාෂාව ද එයට අනුරූප ව පරිණාමයට ලක්වෙයි. නූතන විද්‍යාත්මක පැහැදිලි කිරීම්වලට අනුව භාෂාවේ ආකෘතික ලක්ෂණ එම භාෂාව භාවිත කරන සංස්කෘතික කණ්ඩායම් ජීවත්වන පරිසරය සහ එමගින් හැඩ ගැන්වෙන චර්යාත්මක විවිධතාවලට සමාන්තර වෙයි. එහෙයින් භාෂාවක අනන්‍යතාව යනු සංස්කෘතික අනන්‍යතාවේ දර්ශකය යි. ඒ අරුතින් ගත් කල සිංහල භාෂාව හා එහි නිර්මාණාත්මක භාවිතය වන සාහිත්‍ය මෙන් ම අවශේෂ කලාංග හා අස්පර්ශනීය උරුම ද සංස්කෘතික ප්‍රකාශන කාර්යයක නියැළෙයි. ශීඝ්‍රයෙන් වෙනස්වීම්වලට ලක්වන නොඉඳුල් පරිසර පද්ධතිය හා නූතන තාක්ෂණය නිසා පරිවර්තනය වන චර්යා රටා, භාෂාවක අනන්‍යතා ලක්ෂණ නිර්මාණය කරන අයුරු අධ්‍යයනය කිරීම පර්යේෂණාත්මක නිමිත්තකි. ඒ සඳහා මංපෙත් විවර කෙරෙන විෂයානුබද්ධ ශාස්ත්‍රීය සංකථනයක නියැළීම මෙම ශාස්ත්‍රීය ප්‍රභාෂණයේ අධ්‍යාශය යි.

### මාර්ගෝපදේශ

---

■ **ශාස්ත්‍රීය ප්‍රභාෂණය- 2023 <u>ප්‍රස්තුතීකරණය කරන ලද පර්යේෂණ පමණක්</u> සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා ලෙස ප්‍රකාශයට පත් කෙරේ.**

■ පර්යේෂණ පත්‍රිකාවේ අන්තර්ගතය පහත උපමාතෘකා යටතේ ඉදිරිපත් කළ යුතු ය:

- ➢ හැඳින්වීම (පර්යේෂණ ගැටලුව, අරමුණු, වැදගත්කම සහ / හෝ පැහැදිලි කිරීම්)
- ➢ ක්‍රමවේදය (පර්යේෂණ සැලසුම/ දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණ ක්‍රම)
- ➢ ප්‍රතිඵල
- ➢ සාකච්ඡාව
- ➢ නිර්දේශ / අනුමිතීන්

■ නිසි ලෙස නම් කර ඇති රූප සටහන්, වගු සහ රූප, සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකාවේ අඩංගු කළ හැකි ය.

■ ඔබට අවශ්‍ය අවස්ථාවල දී ඕනෑම පාදක සටහනක් ඇතුළත් කළ හැකි ය.

■ අවශ්‍ය අවස්ථාවල දී පෙළ තුළ උපුටා දැක්වීම ඇතුළත් කළ යුතු අතර ආශ්‍රේය ග්‍රන්ථනාම ලැයිස්තුව ප්‍රධාන පෙළට පසු ව යෙදිය යුතු ය.

■ ආශ්‍රේය ග්‍රන්ථනාම ලැයිස්තුව යෙදීමේ ශෛලිය: (APA - 7 වන සංස්කරණය)

■ සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකාවේ වචන ප්‍රමාණය (ආශ්‍රේය ග්‍රන්ථනාම ලැයිස්තුව හැර): වචන 5000-7000

■ කරුණාකර ඔබගේ සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකාව පැහැදිලි, දෝෂ රහිත ශාස්ත්‍රීය ඉංග්‍රීසි හෝ සිංහල භාෂාවෙන් ලියා ඇති බවට සහතික වන්න. ඔබේ අධ්‍යයන ක්ෂේත්‍රයට විශේෂ වූ ඕනෑම පාරිභාෂික පදයක් වේ නම් ඒවා කෙටියෙන් අර්ථ දැක්විය යුතු ය.

■ ඔබේ සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකාව සිංහල භාෂාවෙන් ලියා ඇත්නම් වචන 300කට නොවැඩි ඉංග්‍රීසියෙන් ලියන ලද සාරසංක්ෂේපයක් ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ.

**ආකෘතිය**

■ පිටුවේ ප්‍රමාණය - A4 ප්‍රමාණය

■ අකුරු වර්ගය - Times New Roman/ FM Abhaya

■ අකුරු ප්‍රමාණය -

ශීර්ෂ - 14 තද කළු අකුරු (bold)

උපශීර්ෂ - 12 තද කළු අකුරු (bold)

පෙළ සහ ආශ්‍රේය ග්‍රන්ථනාම ලැයිස්තුව - 12

■ පේළි පරතරය - 1.5

■ පිටුවේ සීමාව - සෙ.මී 1.5

■ වෙන ම පිටුවක පහත දෑ ඇතුළත් කරන්න

ඔබේ නම - කර්තෘ 1 (නම, අනුබද්ධ ආයතනය)

සම-කර්තෘ 2 (නම, අනුබද්ධ ආයතනය)

සම-කර්තෘ 3 (නම, අනුබද්ධ ආයතනය)

කර්තෘ 1 ගේ ලිපිනය, ඊමේල් ලිපිනය සහ දුරකථන අංක සහ ජීව දත්ත තොරතුරු කෙටියෙන් (ශාස්ත්‍රීය, වෘත්තීය සහ පර්යේෂණ පසුබිම ඇතුළුව වචන 100 ක් පමණ) ඇතුළත් කරන්න

සියලු ම සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා (pdf සහ word යන ආකෘති දෙකෙන් ම) ncss@kln.ac.lk වෙත **2024 මැයි 31 දින** හෝ ඊට පෙර විද්‍යුත් තැපැලෙන් එවිය යුතු ය.

වැඩිදුර විස්තර සඳහා සිංහල අධ්‍යයන අංශයේ වෙබ් පිටුව වෙත යොමුවන්න

# Research Symposium 2023 – Department of Sinhala
# Univesity of Kelaniya

## Calling Full Papers

### Cultural Identity and Sinhala Literary Studies

Language is the reflection of culture. The cultural diversity evident throughout the world gives languages their identity. As culture is a continuously growing phenomenon, language also evolves accordingly. According to modern scientific explanations, the structural characteristics of language align with the environment in which the cultural groups using that language live and the behavioural diversity shaped by it. Therefore, the identity of a language is the indicator of cultural identity. In that sense, the Sinhala language and its creative use of literature as well as residual arts and intangible heritage, are engaged in cultural expression. It is an experimental purpose to study how the changing behaviour patterns due to the rapidly changing ecosystem and modern technology create the characteristics of identity of a language. This scholarly symposium aims to engage in a subject-oriented academic conversation that paves the way for such research.

## Guidelines

---

- **Research papers presented at the NCSS – 2023 will ONLY be published as full papers**
- The content should be presented under the following subheadings:
    - ➢ Introduction (should include research problem, objectives, significance and / or justification)
    - ➢ Methodology (research design/ data collection and analysis methods)
    - ➢ Results
    - ➢ Discussion
    - ➢ Recommendations/ Implications
- The full paper can contain figures, tables and images that are labelled properly.

- You may include any footnotes where necessary.
- The body should include in-text citation where necessary and the reference list should follow the main body
- Referencing style: (APA – 7th Edition)
- Length of the full paper (excluding references): 5000-7000 words
- Please ensure that your full paper is written in clear, error-free academic English or Sinhala. Any terminology specific to your field of study should be defined briefly.
- If your full paper is written in Sinhala you are requested to provide an abstract written in English of not more than 300 words.

**Format**

- Page size - A4
- Font type - Times New Roman/ FM Abhaya
- Font size - Heading - 14 (bold, title case)
  Subheadings - 12 (bold)
  Body and references - 12
- Spacing - 1.5
- Margin - 1.5 cm

- On a separate sheet include the following
  Include your name Author1 (name, affiliation)
  Co-author 2 (name, affiliation)
  Co- author 3 (name, affiliation)
  Include address, email and phone numbers and a short bio (about 100 words; academic, professional and research background) of author 1

All full papers should be e-mailed (both in pdf and word formats) to ncss@kln.ac.lk **on or before 31 May 2024**

**For more information**

Visit us - https://hu.kln.ac.lk/depts/sinhala/